# එයාර්ටෙල් Anytime Bonus Data Rewards හඳුන්වා දෙයි

- ඩේටයිම් හෝ නයිට් ටයිම් සැඟවුණු ගාස්තු නොමැත
- දැනට වෙළෙඳපොලෙහි වැඩිම දීමනා හා නම්‍යශීලී විසඳුම් ලබාදීම

එයාර්ටෙල් යනු ශ්‍රී ලංකාවේ වඩාත්ම තාරුණ්‍ය ඉලක්ක කරගනිමින් ව්‍යාපාරකරණයෙහි නියැලෙන ජංගම විදුලි සංදේශ සේවා සැපයුම්කරුවායි. සිය පාරිභෝගිකයින් වෙතින් දිනෙන් දින ඉහළ යමින් පවතින ඉල්ලීම් සලකා බලමින් නව bonus data දීමනා යෝජනාක්‍රමයක් හඳුන්වා දුන් බව එයාර්ටෙල් සමාගම නිවේදනය කර සිටී. ලෝකය දිනෙන් දින ඩිජිටල්කරණය වීමේදී මොබයිල් ඩේටා සඳහා පවතින ඉල්ලුම ඉහළ යාම සාමාන්‍ය තත්ත්වයක් බවද පැවසිය යුතුය.

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට විවිධ ඩේටා පැකේජයන් සඳහා 50% දක්වා අමතර ඩේටා හිමිකර ගැනීමට එයාර්ටෙල් පාරිභෝගිකයින්ට දැන් හැකියාව තිබෙන අතර, ඒ සඳහා අමතර අයකිරීමක් නොමැත. සැඟවුනු ගාස්තු කිසිවක් නොමැති ‘App Bonus Data’ යෝජනා ක්‍රමය සෑම එයාර්ටෙල් පාරිභෝගිකයෙකුටම විවෘතය. ඩේටා රීචාර්ජ්, රීලෝඩ් කිරීම්, ක්‍රෙඩිට් හෝ ඩෙබිට් කාඩ් මගින් සිදුකරන අන්තර්ජාල මිලදී ගැනීම් සහ in-app මිලදී ගැනීම් සඳහා ඉතා පහසුවෙන් මෙම දීමනා ලබාගත හැකිය.

එයාර්ටෙල් පාරිභෝගිකයින්ට ඔවුන්ගේ MyAirtel App සමග සම්බන්ධ වෙමින් bonus data දීමනා ලබාගැනීමට හැකියාව ලබා දී තිබෙන අතර MyAirtel App තවමත් සක්‍රිය කරගෙන නොමැති පාරිභෝගිකයින්ට මොබයිල් ඩේටා ලබාගැනීමේදී ස්වයංක්‍රීය කෙටි පණිවිඩයක් හරහා යෙදවුම් සබැඳිය (app link) ලබාදීමට කටයුතු කෙරේ.

‘‘ඩේටා භාවිතාව දිනෙන් දින ඉහළ යන ආකාරය අපි මැනවින් අවබෝධ කරගෙන සිටින අතර, පාරිභෝගික අත්දැකීම ඉහළ නංවන විසඳුම් ලබා දීමට එයාර්ටෙල් සමාගම කටයුතු කරනවා. දිවා හෝ රාත්‍රී කියා භේදයකින් තොරව අන්තර්ජාලය පරිශීලනය කරන පාරිභෝගිකයින්ට සිය අන්තර්ජාල සබඳතාවයෙහි වේගය වැඩිවීම ඉතාමත් වැදගත්. අන්තර්ජාල සබඳතාවයකට වැඩි අගයක් ලැබෙන්නට එය ප්‍රධාන හේතුවක්. ඩේ ටයිම් නයිට් ටයිම් සීමාවන් බිඳිමින් තම අන්තර්ජාල සබඳතාවය සැඟවුනු කොන්දේසි හෝ බාධාවන්ගෙන් තොරව අත්විඳින්නට අපි අවස්ථාව සලසා දී තිබෙනවා. පාරිභෝගිකයාට උපරිමය ලබා දෙමින් ඔවුන්ගේ සන්නිවේදන අවශ්‍යතා සවිබලගැන්වීම වෙනුවෙන් අපි පුළුල් කැපවීමක් සිදුකරනවා.’’ යනුවෙන් අදහස් දක්වා සිටියේ එයාර්ටෙල් ලංකා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී සහ කළමනාකාර අධ්‍යක්ෂ ජිනේෂ් හෙජ් මහතාය.

පාරිභෝගිකයාට උපරිම ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කරන එයාර්ටෙල් සමාගම සිය පාරිභෝගිකයින්ට ගාස්තු අයකිරීමකින් තොරව 4G සිම්කාඩ්පතකට තම සිම්පත පරිවර්තනය කරගැනීමේ හැකියාව ලබා දී තිබෙන අතර, ඒ සඳහා 5GB ඩේටා නොමිලේ හිමිවීමද විශේෂත්වයකි. 780 හෝ *780# අමතා හෝ සිම්පත් මාරු කරන ආසන්නතම අලෙවි ප්‍රදර්ශනාගාරය වෙත පැමිණ මෙම දීමනා ලබාගැනීමේ ආරම්භය සනිටුහන් කරන්නට එයාර්ටෙල් පාරිභෝගිකයින්ට අවස්ථාව ලබා දී ඇත.

#AirtelThanks යනු එයාර්ටෙල් සමාගමේ විශේෂ දීමනා වැඩසටහනක් වන අතර තම අන්තර්ජාල භාවිතාව අනුව බොහෝ සේවා ප්‍රමාණයකට අමතර දීමනා ලබාදීමට එය කටයුතු කරයි. මෙම දීමනා, ගනුදෙනු හා වට්ටම් ‘My Airtel’ App ඔස්සේ ලබාගැනීමට එයාර්ටෙල් පාරිභෝගිකයාට අවස්ථාව ලබා දී තිබේ. ‘My Airtel’ App නොමිලේ පාරිභෝගික සේවා ලබා දෙන යෙදවුමක් වන අතර ශ්‍රී ලංකාවේ සෑම එයාර්ටෙල් පාරිභෝගිකයෙකුටම එහි ප්‍රතිලාභ අත්විඳිය හැක. ‘My Airtel’ App භාවිතා කරමින් පාරිභෝගිකයින්ට ඔවුන්ගේ ගිණුම් වෙත පිවිසිය හැකි අතර, දත්ත භාවිතාව පරීක්ෂාව, රීචාර්ජ් කිරීම, බිල් ගෙවීම සහ සංගීතය හා චිත්‍රපටි රසවිඳීම ඇතුළු තවත් විනෝදාත්මක අංග රැසකට අවස්ථාව ලැබී තිබේ.

**-අවසන්-**

**Press Release**

**භාරතී එයාර්ටෙල් ලංකා සමාගම**

2009 ජනවාරි 12 වැනි දින ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු ආරම්භ කළ එයාර්ටෙල්, ග්‍රාහකයින් මිලියන 01 ඉතාමත්ම ඉක්මනින් සම්පූර්ණ කළ ජංගම සන්නිවේදන සේවා සමාගමයි. වර්ෂ තුනක් වැනි කාලසීමාවක් තුළ සිය ශ්‍රේණිගතවීම ඉහළ නංවාගත් එයාර්ටෙල් සමාගම රට පුරාම සිය ආවරණය පුළුල් කරගනිමින් ශ්‍රී ලංකාවේ වේගවත්ම ජංගම සන්නිවේදන සේවා ජාලය බවට පත්විය. වර්තමානයේදී එයාර්ටෙල් සමාගම උසස් තත්ත්වයේ සහ සාධාරණ මිල ගණන් යටතේ හඬ සහ දත්ත සේවාවන් ලබා දෙන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ලියාපදිංචි වෙමින් මෙරට වඩාත් වේගවත් හා පුළුල් ආවරණයක් හිමි ජංගම විදුලි සංදේශ සේවා සමාගමක් බවට පත්ව තිබේ. වැඩි විස්තර සඳහා www.airtel.lk වෙත පිවිසෙන්න.